පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ 2021 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2021 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පුත්තලම දිස්ත්‍රික් ලේකම් කර්යාලය වෙත ඉදිරිපත් කරනු ලබන මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ සඳහන් වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව ගණකාධිපති නිලධාරි වෙත වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව යථා කාලයේ දී නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව ඉදිරිපත් කළ යුතු විගණකාධිපති වාර්තාව යථා කාලයේදී පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

2

No. 306/72, Polduwa Road, Battaramulla, Sri Lanka.
+94 11 2 88 70 28 - 34 | +94 11 2 88 72 23 | ag@auditorgeneral.gov.lk | www.naosl.gov.lk

පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය ප්‍රකාශනවලින් 2021 දෙසැම්බර් 31 දිනට පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශය සොයුමේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සකස් කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

1.2 මතය සඳහා පදනම

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ/ගණන්දීමේ නිලධාරීගේ (අදාළ වන පරිදි) වගකීම වේ. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය/ දෙපාර්තමේන්තුව/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ/ දෙපාර්තමේන්තුවේ/ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායී අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ගණන්දීමේ නිලධාරී (අදාළ වන පරිදි) සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායීත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක්

සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායී ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම් නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එම ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවශ්‍යතාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම් ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- මෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල වලංගුභාව හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී/ ගණන්දීමේ නිලධාරී දැනුවත් කරමි.

1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(ඇ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන ලෙස පිළියෙල කර ඇත.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

2. මූල්‍ය සමාලෝචනය

2.1 අග්‍රිම කළමනාකරණය

අග්‍රිම උපයෝජනය සම්බන්ධයෙන් පහත සඳහන් කරුණු විගණනයේ දී නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) 2021 වර්ෂයේ මුළ ලැබීම් රු.4,887,811,982 ක් වූ අතර, ඉන් මහා භාණ්ඩාගාරයෙන් අග්‍රිම මුදල් ලෙස ලැබී තිබූ ප්‍රමාණය රු.4,111,132,000ක් විය. එය මුළ ලැබීම්වල ප්‍රතිශතයක් ලෙස සියයට 84 ක් විය. 2021 වර්ෂයේ මුළ වියදම රු.1,969,676,722 ක් වූ අතර, එය පියවා ගැනීම සඳහා ලබාගත් අග්‍රිම මුදල් රු.4,887,811,982ක් පමණක් භාවිතා කර තිබුණි. එය මුළ වියදමේ ප්‍රතිශතයක් ලෙස සියයට 248 කි.

(ආ) 2021 වර්ෂයේ මුළ වියදම පියවා ගැනීම සඳහා වෙනත් මූලාශ්‍ර ලෙස ලැබී තිබූ මුදල් රු.776,679,982ක් භාවිතා කර තිබුණි.

2.2 නැන්පතු ගිණුම් යෝජ

කැන්පත් කළ දින සිට වසර දෙක ඉක්ම වූ නැන්පතු ගිණුම් වර්ග 06 කට අදාළ එකතු වටිනාකම් රු.11,552,195 ක් වූ පොදු කැන්පත් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

2.3 වියදම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වැය විෂයයන් 12 ක් සඳහා ඇස්තමේන්තු ප්‍රතිපාදන වලට සාපේක්ෂව ඉතිරිවීම් ප්‍රතිශතය සියයට 11 සිට සියයට 96 දක්වා පරාසයක් ගෙන තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම්වල 2021 වර්ෂය සඳහා අයවැයගත ඇස්තමේන්තු ප්‍රතිපාදනවල එකතුව පිළිවෙලින් රු.860,000,000 ක් සහ රු.181,000,000 ක් වුවද, පුනරාවර්තන හා ප්‍රාග්ධන වියදම් සඳහා පිළිවෙලින් රු.540,600,000 ක් හා රු.100,000,000 ක පරිපූරක ඇස්තමේන්තුගත ප්‍රතිපාදන වෙන් කරවාගෙන තිබුණු අතර, එය අයවැයගත ප්‍රතිපාදනවලට සාපේක්ෂව සියයට 63 ක හා සියයට 55 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

(ඇ) වාර්ෂික ඇස්තමේන්තුවේ නොමැති පුනරාවර්තන වැය විෂයයන් දෙකක් සඳහා හා මූලධන වැය විෂයයන් එකක එකතුව රු.640,600,000 ක පරිපූරක ඇස්තමේන්තු ප්‍රතිපාදන අනුමත කරවාගෙන තිබුණි. 2021 දෙසැම්බර් 31 දිනට එම පරිපූරක ප්‍රතිපාදනවලින් ඉතිරිවීම්වල ප්‍රතිශතය සියයට 6 ක් සියයට 96 ක් අතර විය.

2.4 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නීති, රීති හා රෙගුලාසිවලට යොමුව	අනුකූල නොවීම
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මූදල් රෙගුලාසි සංග්‍රහයේ 109 ඡේදය	1989 වර්ෂයේ සිට 2021 වර්ෂය දක්වා කාලය තුළ අලාභහානි සිදුවී වසර එකක සිට වසර 30 ක කාලයක් ගතවී ඇතත්, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් වාහන 19 ක් සඳහා කපා නොහළ අලාභ හානිවල එකතු වටිනාකම රු.3,064,063 ක අගය අදාළ වගකිව යුතු නිලධාරීන්ගෙන් අයකර ගැනීමට හෝ පොන්වලින් කපා හැරීමට අවශ්‍ය පියවර ගෙන නොනිබුණි.

2.5 අත්තිකාරම් නිකුත් කිරීම හා පියවීම

දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 03 ක වැඩ තහනම් කර නිබුණු නිලධාරීන් 05 කගෙන් අයකර ගතයුතු එකතුව රු.382,752 ක් හා ප්‍රාදේශීය ලේකම් කාර්යාල 04 ක වසර එකක් 14 ක් අතර කාලයක් සිට සේවය අතහැර ගිය නිලධාරීන් 04 කගෙන් අයවිය යුතු එකතුව රු.410,000 ක ණය ශේෂ අයකර ගැනීමට ප්‍රමාණවත් ක්‍රියාමාර්ග ගෙන නොනිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්යසාධනය

3.1.1 අපේක්ෂිත නිමවුම් මට්ටම් ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුත්තලම හා මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල 2021 වර්ෂයේ දී ඇස්තමේන්තු කර නිබුණු ව්‍යාපෘති 46 ක් වෙනුවෙන් ඇස්තමේන්තු කළ මුදලෙහි එකතු වටිනාකම රු.69,629,383 ක් වූ අතර, ප්‍රගතිය සියයට 20 - 25 ත් අතර, ප්‍රමාණයක් වූ අතර, ප්‍රතිපාදන නොමැති වීම හේතුවෙන් අතරමඟ නවතා දමා නිබුණි.

(ආ) සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන වැඩසටහන යටතේ සුන්කලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය සඳහා අනුමත කිරි ආශ්‍රිත නිෂ්පාදන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීම සඳහා රු.4,112,675ක මුදලක් අනුමත කර තිබූ අතර, ප්‍රතිලාභීන් වෙත මුදල් බෙදාදීමට පමණක් සීමාවී තිබූ හෙයින්, ව්‍යාපෘතියේ අපේක්ෂිත අරමුණු ඉටුවන පරිදි ව්‍යාපෘතිය නිමකර නොතිබුණි.

3.1.2 අපේක්ෂිත ප්‍රතිලාභ (Outcome) ලබා නොගැනීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) වෙන්නප්පුව ජෝෂප්වාස් විද්‍යාලයේ ක්‍රීඩාගාරයේ වහලය සකස් කිරීමට 2014 වර්ෂයේ දී රු.48,638,504 ක සිවිල් වැඩ ඇස්තමේන්තුවක් යටත් කටයුතු කර තිබුණි. වර්තමානය වනවිට ද, මෙම ක්‍රීඩාගාරය ප්‍රතිලාභයක් නොලබා අසම්පූර්ණ ව්‍යාපෘතියක් ලෙස පවතින බව නිරීක්ෂණය විය.

(ආ) වෙන්නප්පුව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් රු.1,467,477 ක් වැයකර 2021 වර්ෂයේ දී ඉදිකර තිබුණු වයික්කාල එකමුතු වොලිබෝල් ක්‍රීඩාංගනය වගුරු බිමක් ගොඩකර ඉදිකර තිබුණු අතර, එම ක්‍රීඩාංගනය භූමිය තැනින් තැන පුපුරා ගොස් තිබූ අතර, විගණිත දිනවන 2022 පෙබරවාරි 07 දින වන විටත් නිශ්කාර්යව පැවතුණි.

(ඇ) මුදල් අමාත්‍යාංශය මගින් 2021 ජූලි 07 දාතම වූ හලාවත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කනත්තව ග්‍රාම නිලධාරී වසම සඳහා රු.5,176,250 ක් සඳහා කිරිගව පාලනය හා කිරි ආශ්‍රිත නිෂ්පාදිත ක්‍රියාකාරකම් කඩිනමින් ක්‍රියාත්මක කරන ලෙස උපදෙස් ලබාදී තිබුණි. කිරිගවයින් ලබාදීමේ දී රු.200,000 ක් වටිනාකමට අඩු එනම්, රු.150,000 ක් හා රු.69,000 වැනි පැටවුන් ද මිලදී ගෙන තිබීමෙන් ව්‍යාපෘතියෙන් බලාපොරොත්තු වූ අරමුණු ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

3.1.3 අතහැර දැමූ ව්‍යාපෘති

මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අනුමත ප්‍රතිපාදන මුදල රු.990,000 ක් වූ මාර්ග දෙකක් වැඩිදියුණු කිරීම සඳහා ප්‍රජාමූල සංවිධාන සමඟ ගිවිසුම්ගත වී තිබුණ ද, ABC සඳහා ලබා

දියයුතු Compaction Test වාර්තා ලබා නොදීම, ප්‍රමාණවත් කාලයක් නොමැති වීම මත ක්‍රියාත්මක කිරීමට නොහැකි වී තිබුණි.

3.2 ප්‍රසම්පාදනයන්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් හා ප්‍රසම්පාදන කාල සටහනක් සකස් කර නොතිබුණි.

(ආ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සමාලෝචිත වර්ෂයේ දී කාඛනික පොහොර නිෂ්පාදන ගොවීන්ට බෙදාදීමට අවශ්‍ය උපකරණ මිලට ගැනීම වෙනුවෙන් අවස්ථා 08 ක දී එකතුව රු.54,689,300 ක් වූ ප්‍රසම්පාදන 08 ක් සිදුකර තිබූ අතර, අවසන් ප්‍රසම්පාදන තීරණය ලබාදීම දක්වා ප්‍රසම්පාදන කාර්යයන් අවසන් කර තිබුණ ද, අදාල උපකරණ මිලදීගෙන අපේක්ෂිත කාර්යය ඉටුකිරීමට අපොහොසත්ව තිබුණි. ඒ හේතුවෙන් ප්‍රසම්පාදන කාර්යයන් සඳහා වැයකල ශ්‍රමය සහ සම්පත් නිශ්කාර්ය වියදම් බවට පත්ව තිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රසම්පාදන තීරණ හා තාක්ෂණික ඇගයීම් තීරණ අනුඅංක කර ලේඛනයක පවත්වා නොගෙන ලිපිගොනුවක පැවතුණ බැවින්, එම තීරණ ඉවත් කිරීමට හා සකස් කිරීමට ඉඩකඩ නිර්මාණයක් කරගෙන තිබුණි.

(ඈ) ප්‍රසම්පාදන තීරණ වාර්ෂික සමාලෝචනයක් කර ඵලදායිතාවය පරීක්ෂා කර නොතිබුණු බැවින් ක්‍රියාත්මක වූ හා නොවූ තීරණ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රසම්පාදන අංශය දැනුවත් වී නොතිබුණි.

3.3 වත්කම් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය මගින් පාලනය කරනු ලබන නිල නිවාස 71 ක් පැවති අතර, දුර්වල නඩත්තුව සහ දීර්ඝ කාලයක් පිළිසකර නොකිරීම හේතුවෙන් ඉන්

බොහොමයක් නිල නිවාස මිනිස් වාසස්ථානයට හුසුළුසු අයුරින් විනාශ වෙමින් පැවතුණි.

(ආ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලය සතු භාවිතයට සුදුසු නිල නිවාස 05 ක් සුදුසු නිලධාරීන්ට ලබාදීමට අවශ්‍ය කටයුතු නොකිරීම නිසා නිශ්කාර්යව පැවතුණ අතර, භාවිතයට හුසුළුසු තත්ත්වයේ පවතින නිල නිවාස 06 ක් භාවිතයට සුදුසු තත්ත්වයට පත්කිරීමට කටයුතු නොකිරීම හේතුවෙන් නිශ්කාර්යව පැවතුණි. කවද, දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නිල නිවාස 09 ක් වෙනත් ආයතන වෙත පවරා දී ඇති අතර, නිල නිවාස 10 ක් කඩා ඉවත් කර තිබුණු බවත් නිරීක්ෂණය විය.

(ඇ) පුත්තලම නගර සභාව මඟින් පුත්තලම කොළඹ මාර්ගය ඉදිරිපස ගොඩනැඟිල්ලට යාබදව පවතී දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් නිල නිවාසයක් පැවති අක්කර එකකට වැඩි ඉඩම ඇල්ලා ගොඩනැඟිල්ලේ කටයුතු සඳහා පැමිණෙන රථවාහන නතර කිරීමේ කටයුතු සඳහා රථගාලක් ලෙස සංවර්ධනයක් කිරීමට ලබාදී තිබුණු අතර, එහි පැවති නිල නිවාසය පුත්තලම නගර සභාව විසින් කඩා තිබුණි ද, එකඟතාවය පරිදි එම ඉඩමේ වටිනාකමට සමාන ඉඩමක් ලබාගැනීම් කටයුතු කර නොතිබුණි.

(ඈ) ලේකම් කාර්යාලයේ බවුසරය වර්ෂ ගණනාවක සිට භාවිතයකින් තොරව පරිසරයට නිරාවරණව තබා තිබීම හේතුවෙන් දිරාපත් වී පැවතුණි.

3.4 රජයේ නිලධාරීන් ඇප තැබීම

මුදල් රෙගුලාසි 880 හා 885 ප්‍රකාරව අභ්‍යන්තර හා ස්වදේශ කටයුතු සහ පළාත් පාලන අමාත්‍යාංශ ලේකම්ගේ අංක 07/2019 හා 2019 මාර්තු 23 දිනැති දිස්ත්‍රික් පාලන වක්‍රලේඛනයේ 03 වගන්තිය ප්‍රකාරව රජයේ නිලධාරීන් ඇප තැන්පත් කළයුතු වුවත්, 5 වගන්තිය ප්‍රකාරව ඇප තැබීමට නියමිත නිලධාරීන් මාස 03 ඇතුළත ඇප තබා නිමකල යුතු වුවත්, මාදම්පේ ප්‍රාදේශීය ලේකම් ඇතුළු නිලධාරීන් 07 ක් එපරිද්දෙන් ක්‍රියාකර නොතිබූ බව නිරීක්ෂණය විය.

(අ) ඉදිකරමින් පැවති දිස්ත්‍රික් ලේකම් කාර්යාල ප්‍රධාන ගොඩනැගිල්ලේ 14 වන බිල්පත ගෙවීම් ප්‍රතික්ෂේප කර තිබූ අතර, බෙරුම් කරන ක්‍රියාවලියකට ගොස් 14 වන බිල්පත ගෙවීමට සිදුවීමෙන් ප්‍රමාද පොලී ලෙස රු.10,349,580 ක් ගෙවීමට සිදුවී තිබුණි.

(ආ) ඉහත කාරණයට අදාලව ඉදිකිරීම්වල දෝෂ නිවැරදි කිරීමට රු.33,770,564 ක ඉංජිනේරු ඇස්තමේන්තුවකින් සහතික කර තිබුණ ද, බෙරුම් කරන ක්‍රියාවලියේ දී එය නොසලකා හැර කටයුතු කිරීමෙන් රජයට රු.18,235,507 ක අලාභයක් රජයට සිදුවී තිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් වර්ෂ 2016 – 2021 කාලය තුළ නිම කරන ලද ව්‍යාපෘති 13 ක ව්‍යාපෘති නිමකර වසර 1 ත් - 5 ත් අතර, කාලයක් ගතවී තිබුණ ද, එකතුව රු.9,949,016 ක් වටිනා රැඳවුම් මුදල්, එම ව්‍යාපෘතිවල අඩුපාඩු පවතිනම් ඒවා නිම කරවාගෙන ගෙවීම් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) ආරච්චිකට්ටුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ බන්තුළුඔය, සෙංගල් ඔය සහ සුරුවිල යන ග්‍රාම නිලධාරී වසම්වල පවත්වාගෙන යන අනවසර ඉස්සන් ගොවිපලවල් 22 ක් සහ වර්තමානය වනවිට අක්‍රිය තත්ත්වයේ පවතින ගොවිපලවල් 04 ක් පිළිබඳව කොරකුරු වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවට 2019 හා 2020 වර්ෂවලදී යොමු කර තිබුණ ද, එම අනවසර ඉස්සන් ගොවිපලවල් විඟණිත දිනවන 2022 ජනවාරි 14 දින වන විටත්, නවතා දැමීමට නොහැකි වී තිබුණ අතර, වර්ෂ ගණනාවක සිට අනවසරයෙන් ක්‍රියාත්මක වන එම ඉස්සන් ගොවිපොලවල් නවතා දැමිය නොහැකි තත්ත්වයක පසුවන්නේ නම් රජයට ආදායමක් ලැබිය යුතු ආකාරයෙන් එම ඉස්සන් ගොවිපොලවල් යොදවා ගැනීම සම්බන්ධයෙන් වඟකිව යුතු නිලධාරීන්ගේ අවධානය යොමු වී නොතිබුණි.

(ඉ) මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිරි හා කිරි ආශ්‍රිත අතුරු නිෂ්පාදන ව්‍යාපෘතියේ පලමු අදියර යටතේ මිල දී ගත් සතුන් 21 දෙනා සඳහා අපේක්ෂිත බර හා වයස යටතේ මිල දී ගැනීම් සිදුවූයේ නම් රජයේ දායකත්වය ලෙස රු.1,485,000 උපයෝජනය වීමට නියමිත ව තිබූ අතර, ඉහත අඩුපාඩුව මත වැය වී තිබුණු රු.877,140 ක් පමණි. ඒ අනුව ව්‍යාපෘතියෙන් වෙන් කරගනු ලැබූ ප්‍රතිපාදන මත අපේක්ෂිත ඵලදායිතාව ලබා නොගැනීම මත රු.1,485,000 න් රු.607,860 ක් ඉතිරිවී තිබුණි. දෙවන වටයක් යටතේ කිරිගවයින් ලබා දීමට කටයුතු කර තිබුණු අතර, ඒ සඳහා ලබාදුන් කිරිගවයින් රු.80,000ට අඩු වටිනාකමක් ඇති එනම්, කිරි නිෂ්පාදනයට නවත් වසර ගණනාවක් ගතවී අපේක්ෂිත කාර්යසාධනය ප්‍රමාදවන බව නිරීක්ෂණය විය.

(ඊ) මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ කිරි හා කිරි ආශ්‍රිත අතුරු නිෂ්පාදන ව්‍යාපෘතිය මැදගොඩ ග්‍රාම නිලධාරී වසමේ ක්‍රියාත්මක කර නිබුණු අතර, ප්‍රාදේශීය ලේකම්වරිය විසින්, 2021 සැප්තැම්බර් 07, ඔක්තෝබර් 15, දෙසැම්බර් 08 දිනයන්වලදී මැදගොඩ බල ප්‍රදේශයෙන් ම කිරිගවයින් 14 දෙනෙකු මිලදී ගැනීමට අවශ්‍ය කටයුතු සිදුකර නිබුණි. ලිපිගොනුවේ කොරතුරු අනුව ඉන් 10 දෙනෙකු පළමු අදියර යටතේ ද 04 දෙනෙකු දෙවන අදියර යටතේ දී ද මිලදී ගෙන නිබුණි. එනම්, මුල් අදියර යටතේ මිල දී ගත් කිරිගවයින් 21 දෙනාගෙන් විගණන නියැදි පරීක්ෂාවට අනුව 10 ක් එනම්, සියයට 50 ක් එම නිෂ්පාදන ගම්මාන බල ප්‍රදේශයෙන්ම අයිතිය මාරුවීමක් පමණක් සිදුවී ඇති බව විගණනයට නිරීක්ෂණය විය.

(උ) මහවැව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කිරිගවයින් මිලදී ගැනීමේ ව්‍යාපෘතිය කිරි හා කිරි ආශ්‍රිත නිෂ්පාදන ලෙස ක්‍රියාත්මක කිරීම කර නිබුණු අතර කිරි ආශ්‍රිත නිෂ්පාදන ලෙස අයිස්ක්‍රීම්, කිරිටොෆි, මුදවපු කිරි, යෝගට්, චීස් හා අයිස් පැකට් හඳුනාගෙන නිබුණ ද ඒ සම්බන්ධව අවධානය යොමු කර නොනිබුණි.

(ඌ) ග්‍රාම ශක්ති පළමු සහ දෙවන අදියර යටතේ පුත්තලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයට අයත් ග්‍රාම නිලධාරී වසම් 12 ට අයත් සමිති 12 ක් සඳහා මුදල් ලබාදී නිබු අතර, 2021 දෙසැම්බර් 31 දින වනවිට එකතුව රු.9,901,991ක් ශේෂ පැවතුණි. විගණිත අවස්ථාව වනවිට සියලුම ග්‍රාම ශක්ති සමිති අක්‍රිය තත්ත්වයේ පැවතුණි.

(එ) පල්ලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ තම්මන තුන්සරණගම උස්සාන වාරි ව්‍යාපෘතිය වෙනුවෙන් වැයකර නිබුණු සමස්ථ වියදම රු.9,752,604 ක් වූ අතර,මෙම ව්‍යාපෘතිය සඳහා මුදල් රෙගුලාසි 34 ප්‍රකාරව මුළු පිරිවැය ඇස්තමේන්තුවක් පිළියෙල කර නොනිබුණු අතර, ව්‍යාපෘතියේ එක් එක් කාර්යයන් සඳහා වෙන වෙනම ඇස්තමේන්තු පිළියෙල කර ඉටුකර නිබුණි.

(ඒ) පල්ලම ඉබ්බන්වලයාය උස්සාන වාරි ව්‍යාපෘතිය යටතේ කෙසෙල් පැල ලබාදීම වෙනුවෙන් සියයට 50 ක ප්‍රතිලාභී දායකත්වය මත එකතු වටිනාකම රු.112,500 ක මුදලක් 2021 දෙසැම්බර් මස අදාල ප්‍රතිලාභීන්ගෙන් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් අයකර ගෙන නිබුණු අතර, එම ප්‍රතිලාභීන් වෙත කෙසෙල් පැළ බෙදාදීම අවලංගු කර

නිබුණ ද, අයකර ගත් දායක මුදල් නැවත එම ප්‍රතිලාභීන් වෙත ආපසු ගෙවීම් කිරීමට විගණිත දින වන 2022 පෙබරවාරි 14 දින වන විටත්, අවශ්‍ය පියවර ගෙන නොතිබුණි.

(ඇ) මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය මඟින් 2020 සමිතිගමක් ව්‍යාපෘති 143න් ව්‍යාපෘතිය 40 ක අඩුපාඩු සහිත් කරන ලෙස දන්වා යවා තිබුණු අතර, විගණිත දින වෙතකිකව නියැදි පරීක්ෂා කිරීම් අනුව අඩුපාඩු සහිත් කර තිබුණු ව්‍යාපෘති පරීක්ෂා කර ගෙවීම් සඳහා ඉදිරිපත් කර නොමැති බව නිරීක්ෂණය විය.

(ඈ) මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය නාන්නන්ඩිය ප්‍රාදේශීය සභාව මඟින් ක්‍රියාත්මක කරවන ලද සමිතිගමක් සංවර්ධන ව්‍යාපෘති සඳහා මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ 2019 දෙසැම්බර් 06 දිනැති අංක 01/2019 නැමති සංවර්ධන චක්‍රලේඛයේ 11 වැනි වගන්තිය අනුව ව්‍යාපෘති නිශ්චිත විය යුතු අතර, මාර්ගයේ ආරම්භය හා අවසානය තිබිය යුතු වුවද, ඉටුකරන ලද ව්‍යාපෘතිවල නොරතුරු දැක්වීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) මුදල්, ආර්ථික හා ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ 2019.12.06 දිනැති අංක 01/2019 නැමති සංවර්ධන චක්‍රලේඛයේ 02 වැනි වගන්තිය අනුව ග්‍රාමීය ප්‍රජාකම්පුවක් මඟින් හඳුනාගැනීම හා ප්‍රමුඛතාගත කරන සංවර්ධන ව්‍යාපෘති පළාත්පාලන ආයතන හා ප්‍රජාමූල සංවිධාන හරහා ක්‍රියාත්මක කිරීම තුළින් ග්‍රාමීය ප්‍රජාව සංවර්ධන ක්‍රියාවලියට සෘජුවම දායක වීම ද දක්වා තිබුණ ද මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් ප්‍රාදේශීය සභාව සමඟ ඇති කරගනු ලැබූ එකඟතා ගිවිසුමේ කොන්ත්‍රාත්කරුවන් සමඟ ගිවිසුම්ගැනීමට අවශ්‍යවට ලබා දී තිබුණු අතර, නාන්නන්ඩිය ප්‍රාදේශීය සභාව ඒ අනුව එම වැඩනිම් වටිනාකම රු.338,939,143 ක් වූ ව්‍යාපෘති 243 න් ප්‍රජාපාදක සංවිධානවලින් බැහැරව කොන්ත්‍රාත් කරුවන්ට ලබාදී තිබූ බැවින්, චක්‍රලේඛනයට අනුකූල නොවන පරිදි කටයුතු කර තිබුණි.

(ඔ) මහවැව ප්‍රාදේශීය ලේකම් කාර්යාලය විසින් සමිතිගමක් සංවර්ධන වැඩසටහන යටතේ නාන්නන්ඩිය ප්‍රාදේශීය සභාව සමඟ එකඟතා ගිවිසුම් මඟින් ක්‍රියාත්මක කරන ලද ඇස්තමේන්තු වටිනාකම රු.11,891,889 ක වැඩනිම් වටිනාකම රු.11,338,442 ක් වූ මාර්ග සංවර්ධන ව්‍යාපෘති 16 ක නාක්ෂණික නිලධාරී විසින් අදාල මාර්ග මායිම් (Ages) අදාල පරීක්ෂා කිරීම් අනුව ගිලා බැසීමට අවදානම් ස්ථානයන් හි පොළව කපා එය තුළට අඟල් 4 කළගල් (100 mm aggregate) සපයා සැකසීමට අදාල වැඩ විෂයයන් (03) දක්වා

නිබුණු ද, සංවර්ධන ව්‍යාපෘති ක්‍රියාත්මක වන අවස්ථාවේ දී එම ද්‍රව්‍ය ලබාගැනීමේ අපහසුතාවය මත ඉංජිනේරු අනුමැතියක් ලබාගෙන මාර්ගවල දීර්ඝකාලීන පැවැත්මට සෘජු බලපෑමක් වන වැඩ විෂයයන් (03) ඉවත් කර නිබුණු අතර, එම ප්‍රතිපාදන ප්‍රමාණය බොරළු එම්ඕපී, අඟල් 1 ½ m 3/4 m කළුගල් හා පලලුවර තාර දැමීම යන වැඩවිෂයන් යටතේ ඇතුළත් කර නිබුණි.

(ඉ) මහවැව දිස්ත්‍රික් සිවර කාර්යාලය ඉදිරිපස ආලින්දය සකස් කිරීමේ දී වැඩවිෂය අංක 10 හා 12 යටතේ සනකම මිලිමීටර් 0.47 ක් වන සින්ක් ඇලුමිනියම් තහඩු වැඩ සඳහා රු.14,186ක් හා රු.9,514ක් යටතේ සම්පූරණ කර නිබුණ ද, ඒ සඳහා යොදා ඇති තහඩු සවිකිරීමට පෙර 0.47 mm සනකම නිබුණු බවට සටහනක් ලොග් පොතෙහි හෝ ඉහත වැඩ විෂය 11 යටතේ ඉටු කරන ලද Zinc Aluminums downpipe 100 x 100 mm පරිදි අවකාශයක් සහිතව නිමිය යුතු වුවද, විගණන භෞතික පරීක්ෂා කිරීම අනුව 100 x 80 mm ප්‍රමාණයෙන් පවතින බව නිරීක්ෂණය විය.

(ඌ) පල්ලම ඉබ්බන්වලයාය මොළුළිය මංකඩ ආශ්‍රිත උස්සාන වාරි ව්‍යාපෘතිය හා තම්මන තුන්සරණගම උස්සාන වාරි ව්‍යාපෘතිය ඉදිකිරීමේ දී වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්ගේ 2021 අගෝස්තු 26 දිනැති ලිපියක් මඟින් පවතින කාලගුණික රටාව හේතුවෙන් වර්ෂයේ ඇතැම් අවස්ථාවල දැඩුරු ඔයේ ජල මට්ටම සීඝ්‍රයෙන් අඩුවීම නිසා ජල ඒකාබද්ධයක් ඇතිවිය හැකි බැවින්, ඒ සඳහා විකල්ප මාර්ග යොදා ගැනීමට කටයුතු කළයුතු බව සහ 2021 ඔක්තෝබර් 01 දිනැති ලිපියක් මඟින් දැඩුරු ඔයෙන් ලබා ගන්නා ජල ප්‍රවාහය ඉදිරියේ දී මහා පරිමාණ ජල සම්පාදන ව්‍යාපෘතියක් සඳහා යෝජනා කිරීමට හැකියාවක් නොමැති බව සඳහන් කර නිබුණු තත්ත්වයක් තුළ මෙම ව්‍යාපෘති දෙක වෙනුවෙන් රු.19,501,434 ක් වැනි විශාල මුදලක් වියදම් කිරීම විගණනයේ දී මතභේදයට තුඩුදෙන්නක් විය.

(ඍ) පල්ලම ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයේ කම්මන තුන්සරණගම උස්සාන වාරි ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කළ මුදල රු.6099,135 ක් හා පල්ලම ඉබ්බන්වලයාය උස්සාන වාරි ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු කළ මුදල රු.6,700,000 ක් වශයෙන් එම වාරි ව්‍යාපෘති දෙක සඳහා ඇස්තමේන්තු කළ මුදලෙහි එකතු වටිනාකම රු.12,799,135ක් වූ නමුත් වියදම් කළ මුදල රු.19,501,434 ක් වූ හෙයින් ඇස්තමේන්තු කළ මුදල් ඉක්මවා රු.6,702,299 ක මුදලක් වැඩිපුර වියදම් කර නිබුණි.

(ඩ) මහවැව දිස්ත්‍රික් ධීවර කාර්යාලය ඉදිරිපස ආලින්දයේ වහලය හා සිවිලිම අලුත්වැඩියා කිරීමේ අවසන් බිල්පත අනුව වැඩ විෂය 06, 11, 12 යටතේ 0.47 mm ඝනක් ඇලුමිනියම් තහඩු වැඩ සඳහා පිළිවෙලින් රු.164,515, රු.36,278 හා රු.18,150 ක් වැඩ ගෙවීම් සඳහා අදාළ කරගෙන තිබුණ ද, එම තහඩු 0.47 mm ඝණකම් පැවති බව සහතික කිරීමට කරනු ලැබූ භෞතික හා තාක්ෂණික උපකරණ මඟින් කරනු ලැබූ පරීක්ෂණ කර නොතිබුණු අතර, බිල්පත් ද ලිපිගොනුවේ නොතිබූ අතර, වැඩ විෂය 12 යටතේ යොදා තිබුණු ඉහත (අ) යටතේ වූ downpipe තහඩු 100 x 100mm ප්‍රමාණයෙන් වියයුතු වුවද, ඒ පරිදි නොමැති බව විගණනයට නිරීක්ෂණය විය.

3.6 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නව ගොඩනැඟිල්ල සම්බන්ධව මොරටුව විශ්ව විද්‍යාලයේ ඉංජිනේරු අංශයෙන් ලබාදුන් වාර්තාව අනුව ගොඩනැඟිල්ල සැලසුම් (Structharal Design) වල දෝෂ දක්වා ඇති බැවින්, එම කටයුතු කරනු ලැබූ ආයතනය සම්බන්ධයෙන් ගත් ක්‍රියාමාර්ග විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

(ආ) ගොඩනැඟිල්ලක් ඉදිකිරීමේ දී ආසන්නයේ පිහිටා ඇති අධි බලැති විදුලි රැහැන් පවතී නම් නිරස් හා සිරස් දුරස්ථතාවය (Horizontal & Vertical Distance) හා එමඟින් ශාරීරික ව ඇතිවිය හැකි චුම්භක (Magnetic Impact) බලපෑම් සැලකිල්ලට ගෙන කටයුතු කළයුතු වුවද, ඒ පිළිබඳව සැළකිල්ලක් නොදක්වා මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාල ගොඩනැඟිල්ල ඉදිකරමින් පවතින බව නිරීක්ෂණය විය. බිත්තියේ සිට අඩි 2.5 ක් ආසන්නයේ ඇති මෙම විදුලි රැහැන් ඉවත් කර දෙන ලෙස ගොඩනැඟිල්ලේ 03 වන අදියර ඉදිකරන අවස්ථාවේ දී විදුලි බල මණ්ඩලයෙන් ඉල්ලා ඇති අතර, ඒ සඳහා රු.4,023,389 ක් ගෙවිය යුතු බව දන්වා තිබුණි.

.7 නඳුනාගත් අලාභ

පහත කරුණු නිරීක්ෂණය විය.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ ඉංජිනේරු දෙපාර්තමේන්තුවේ මහපොළවීම අනුව ප්‍රාදේශීය ලේකම් කාර්යාල සංවර්ධන වැඩ විෂයයන් සඳහා බෙදාරළු කියුබ් එකක ස්ථානීය මිල (පැවරීම හා රාජ්‍ය භාණ්ඩ ඇතුළත්ව) රු.3,000 ක් වන පළාත් මිල කමිටුවේ ස්ථානීය මිල නාවිතා කර තිබුණු ද , සුන්කලම් දිස්ත්‍රික් ලේකම්ගේ අංක DSP/TFC/CS/01/මි.ක/(1)/2021 හා 2021 ජනවාරි 01 දිනැති දිස්ත්‍රික් මිල කමිටු වාර්තාව අනුව බෙදාරළු කියුබ් එකක් පැවරීම හා රාජ්‍ය භාණ්ඩ ඇතුළත්ව ස්ථානීය මිල රු.2,000 ක් බව දක්වා තිබුණි. ඒ අනුව 2021 වර්ෂයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13 ක් ව්‍යාපෘති 89 ක් සඳහා නාවිතා කරන ලද බෙදාරළු සහ මීටර් 7482.8 ක් හෙවත් කියුබ් 2641.3 ක් නාවිතා කිරීමේ දී කියුබ් එකකින් රු.1,000 ක් බැගින් රු.2,641,300 ක අලාභයක් සිදුව තිබුණි.

(ආ) සුළු හා මධ්‍ය පරිමාන භාල්මෝල් හිමියන් මඟින් වී මිලදී ගෙන එම වී ප්‍රමාණයට සමාන සහල් මෝල් හිමියන් 11 රජයෙන් ගෙවා තිබුණ ද, 2020/2021 මහ කන්නය සඳහා සහල් මෝල් හිමියන් 11 දෙසැම්බර් ලබාදිය යුතු නාඩු සහල් කිලෝ ග්‍රෑම් 402,927 ක් හෙවත් ලබාදිය යුතු සහල් ප්‍රමාණයෙන් සියයට 61.12 ක් ද 2021 යල කන්නය සඳහා රජයෙන් මුදල් ගෙවා මිලදී ගත් වී සඳහා සහල් ලබාදිය යුතු වීමෝල් හිමියන් 19 දෙනාටම අදාළව ලබාදිය යුතු නාඩු සහල් කිලෝග්‍රෑම් 1,006,687ක් හෙවත් ලබාදිය යුතු මුළු සහල් ප්‍රමාණයෙන් 2022 මැයි 24 දිනවන විට ද, ලබාදී නොතිබුණ ද, ඒ සම්බන්ධයෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලය ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි.

(ඇ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ නව ගොඩනැඟිල්ල ඉදිකිරීමේ කොන්ත්‍රාත්තුව අවිධිමත්ව අවලංගු කර ඩෙරුම්කරණයකට යාම මත ඩෙරුම්කරන කටයුතු සඳහා උපදේශන හා සාමාජික ගාස්තු ලෙස රු.1,464,500ක් ගෙවීමට සිදුව තිබුණි.

04. නිරසාර සංවර්ධනය

නිරසාර සංවර්ධන අරමුණු හඳුනා ගැනීම

(අ) දිස්ත්‍රික් ලේකම් කාර්යාලය විසින් සිය විෂයපථයට අදාළව නිරසාර සංවර්ධන අරමුණු හා සම්බන්ධයෙන් වන ඉලක්ක පාදක දත්ත සහ ප්‍රගතිය මැන බැලීම සඳහා දර්ශක හා

නිරසාර සංවර්ධන අරමුණු ක්‍රියාත්මක කිරීම සඳහා ආයතනයේ කාර්යභාරය හා සම්බන්ධ උනන්දුවක් දක්වන පාර්ශවයන් හඳුනාගෙන නොතිබුණි.

(ආ) දේශීය සහ අපද්‍රව්‍ය කළමනාකරණය සඳහා ජාතික ප්‍රතිපත්තියක් ක්‍රියාත්මක වන තත්ත්වය කදී ප්ලාස්ටික් භාවිතය අවම කිරීම සඳහා රාජ්‍ය ආයතන දිරිමත් වියයුතුව ඇති බව නිරීක්ෂණය වුවද, විමධ්‍යගත වැඩසටහන යටතේ ස්වේච්ඡා සංවිධාන වෙත ලබාදීම වෙනුවෙන් දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 ම ප්ලාස්ටික් පුටු , ප්ලාස්ටික් මේස හා ප්ලාස්ටික් වතුර ටැංකි මිලදී ගැනීම වෙනුවෙන් රු.10,973,577 ක් ගෙවා තිබුණි.

(ඇ) ප්ලාස්ටික් තොග පරිසරයට එක්වීමේ අවදානම සහ වර්තමාන හරිත ප්‍රසම්පාදන සංකල්ප ගැන දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල නිලධාරීන් විසින් දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු සහ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු වැනි සංවර්ධන ව්‍යාපෘති සැලසුම් කිරීමේ දී කිසිදු සාකච්ඡාවකට ලක්කර නොසිටීම විගණනයේ දී නිරීක්ෂණය විය.

5 යහපාලනය

මහජනයා වෙත සේවා ඉටු කිරීම

පුරවැසි සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වා නොදීම

පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) 2008 පෙබරවාරි 06 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 05/2008 මඟින් රාජ්‍ය ආයතනයක් වෙතින් සේවා ලබන මහජනතාවට අවශ්‍යතාවන් කඩිනමිව, කාර්යක්ෂමව ගුණාත්මකව හා අඛන්ඩව ඉටුකරනු ලබන බවට ලිඛිත බැඳීමක් ස්ථාපිත කිරීමේ අරමුණින් සියලුම රාජ්‍ය ආයතන විසින් පුරවැසි / සේවාලාභී ප්‍රඥප්තිය හඳුන්වාදිය යුතු බවට අමාත්‍ය මණ්ඩලය තීරණය කර ඇති බවත් ඒ සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්නා ලෙස ඉල්ලා නිබුණු අතර,මාස 06 ක් ඇතුළත සියළු

රාජ්‍ය ආයතන ඒ අනුව කටයුතු කිරීම අපේක්ෂා කර නිබුණද, ඒ අනුව කටයුතු කිරීමට ප්‍රාදේශීය ලේකම් කාර්යාල කිහිපයක හා දිස්ත්‍රික් ලේකම් කාර්යාලය කටයුතු කර නොතිබුණි.

(ආ) කොවිඩ් වසංගතය යටතේ කටයුතු සැලසුම් කර පෙරටු කාර්යාල ක්‍රියාත්මක කිරීමේ අවශ්‍ය ක්‍රියාමාර්ග ගැනීමට මහවැව ප්‍රාදේශීය ලේකම් කටයුතු කර නොතිබුණු අතර, එය ද, පුරවැසි ප්‍රඥප්තියේ අරමුණු ළඟා නොවීමට හේතුවී තිබුණි.

6. මානව සම්පත් කළමනාකරණය

අනුශාස්තෘකාර්ය මණ්ඩලය, තථ්‍ය කාර්ය මණ්ඩලය හා පුද්ගල පඩිනඩි සඳහා වියදම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) 2021 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ හා ඒ යටතේ ඇති ප්‍රාදේශීය ලේකම් කාර්යාල 16 හි අනුමත තථ්‍ය කාර්ය මණ්ඩල පිළිබඳ විස්තර පහත දැක්වේ.

සේවක වර්ගය	අනුමත සේවක සංඛ්‍යාව	තථ්‍ය සේවක සංඛ්‍යාව	පුරප්පාඩු සේවක සංඛ්‍යාව
i. ජ්‍යෙෂ්ඨ මට්ටම	77	70	07
ii. තෘතියික මට්ටම	58	31	27
iii. ද්විතියික මට්ටම	1810	1538	272
iv. ප්‍රාථමික මට්ටම	167	121	46
එකතුව	2112	1760	352

පහත කරුණු නිරීක්ෂණය විය.

(ඇ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයේ අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 12 කට අදාලව සේවක පුරප්පාඩු සංඛ්‍යාව 26 ක් විය.

(ආ) පුත්තලම දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට අයත් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අනුමත කාර්ය මණ්ඩලය තුළ තනතුරු 18 කට අදාලව සේවක පුරප්පාඩු 326 ක් පවතින බව නිරීක්ෂණය විය.

එම්.එස්.නයනකුමාර
සහකාර විගණකාධිපති
විගණකාධිපති වෙනුවට.

M. S. Nayanakumara
Assistant Auditor General
National Audit Office

04 පරිච්ඡේදය - කාර්ය සාධන දර්ශක

4.1 ආයතනයේ කාර්ය සාධන දර්ශක (ක්‍රියාකාරී සැලැස්ම මත පදනම්ව)

විශේෂිත දර්ශක	අපේක්ෂිත නිමැවුමේ ප්‍රතිශතයක්(%) ලෙස තත්‍ය නිමැවුම		
	90% -100%	**75% - 89%**	**50% - 74%**
මානව සම්පත් සංවර්ධන දේශිය හා විදේශිය පුහුණුව	99.5%		
ප්‍රසම්පාදන සැලැස්ම අනුගතවීම		85 %	
වාර්ෂික ඇස්තමේන්තු තුළින් සපයා ගන්නා ප්‍රතිපාදන ප්‍රශස්ත උපයෝජනය	90%		
දිස්ත්‍රික්කයට ලැබෙන සියළුම මූල්‍ය ප්‍රතිපාදන අපේක්ෂිත ඉලක්ක කරා මෙහෙයවීම	95%		
ප්‍රතිපාදන අරපිරිමෙස්මෙන් හා කාර්යක්ෂමව මෙහෙයවීම සම්බන්ධව අභ්‍යන්තර පාලනය	98%		
හරිත ඵලදායිතාව සහ පොලිතින් රහිත පරිසරය		80%	
තාක්ෂණය සහ මෘදුකාංග භාවිතය	93%		
ආදායම් උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මකවීම		75 %	
පරිසර සංරක්ෂන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම		88 %	

05 පරිච්ඡේදය - තිරසර සංවර්ධන අරමුණු (SDG) සපුරා ගැනීමේ කාර්ය සාධනය

5.1 හඳුනා ගන්නා ලද අදාල තිරසාර සංවර්ධන අරමුණු

ඉලක්කය/ අරමුණ	ඉලක්ක	ජයග්‍රහණ දර්ශක	මේ දක්වා ජයග්‍රහණය ලබා ගැනීමේ ප්‍රගතිය		
			0%-49%	50% 74%	75%-100%
01. සෑම තැනකම සෑම ආකාරයකම දරිද්‍රතාව තුරන් කිරීම	**සියළුම ආකාරයේ දරිද්‍රතාවයන්ගෙන් පෙළෙන සියළුම වයස් කාණ්ඩවලට අයත් පිරිමින් කාන්තාවන් හා ළමුන්ගේ අනුපාතය 2025 වනවිට අවම වශයෙන් අඩකින් අඩු කිරීම**	• දරිද්‍රතාවෙන් පෙළෙන පවුල්වල රැකියා අපේක්ෂිත තරුණ තරුණියන් 800 ක් රැකියා ගත කිරීම • පුහුණු වැඩසටහන් 32 ක් පැවැත්වීම • ව්‍යාපාර ආරම්භ කිරීමට ණය 506 දෙනෙකුට ලබා දීම • පවුල් 2740 ක් ආදායම් උත්පාදනයට යොමු කිරීම • ගෘහ ඵලදායිතා වැඩසටහන් 32 ක්හදුන්වාදීම, සම්බන්ධීකරණය • මත් නිවාරණ දැණුවත් කිරීම් වැඩසටහන් 48 ක් පැවැත්වීම • පුද්ගලයින් 80 ට ස්වයං රැකියා ආධාර ලබා දීම හා යොමු කිරීම් • ව්‍යවසායකත්ව සංවර්ධන වැඩසටහන් 16 ක් පැවැත්වීම • ඉතුරුම් ප්‍රවර්ධන වැඩසටහන් 48 ක් පැවැත්වීම • විගමනික පවුල්වල සාමාජිකයන්ව මූල්‍ය කළමණාකරණය පිළිබඳ දැනුවත් කිරීම 32 ක් පැවැත්වීම. • අත්යන්ත්‍ර ඇඟළුම් කර්මාන්තය සවිබල ගැන්වීම සඳහා කාන්තාවන් 10 ක් යොමු කිරීම	46% 46% 43% 46%	73 % 55% 59% 62% 63%	89% 88 %
02. සාගින්න දුරලීම, ආහාර සුරක්ෂිතතාවය හා ඉහල පෝෂණ තත්ත්වයක් සාක්ෂාත් කර ගෙන තිරසර කෘෂිකර්මය ප්‍රවර්ධනය කිරීම.	2030 වර්ෂය වන විට සාගින්න තුරන් කිරීම සහ විශේෂයෙන් දරුවන් ද ඇතුලත්ව දරිද්‍රතාවයෙන් පෙළෙන හා අවධානමට ලක්ව තිබෙන ජනතාවට ආරක්ෂාකාරී පෝෂණයෙන් යුත් ප්‍රමාණවත් ආහාර වසර පුරා ලබා ගැනීමට හැකි බව තහවුරු කිරීම	• ආහාර හා පෝෂණය පිළිබඳව දැනුවත් කිරීමම වැඩසටහන් 32 ක් පැවැත්වීම • තරුණ කෘෂි ව්‍යවසායකයන් 80 ක් මෙහෙයවීම • ලක්ෂ 10 අවම ආයෝජනයක් සහිත ගොවිපල ප්‍රවර්ධනය 03ක් පැවැත්වීම • සුළු පරිමාණ කාබනික පොහොර ව්‍යාපෘති 100ක් සවිබලගැන්වීම • පස හා ජල සංරක්ෂණය තුලින් ඌන පරිහරන කෘෂිකාර්මික ඉඩම්වල ඵලදායිතාව ඉහල	48%	56% 60% 70%	

		නැංවීමේ වැඩසටහන් 10ක් පැවැත්වීම • පසු අස්වනු තාක්ෂණය පිළිබඳ දැනුවත් කිරීම වැඩසටහන් 16 ක් පැවැත්වීම		52% 55%	
03.නිරෝගී ජීවිතයක් තහවුරු කිරීම සහ සෑම වයසකදීම යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම	2030 වන විට බෝනොවන රෝග නිසා සිදුවන අකල් මරණ ප්‍රතිකාර මඟින් හා වලක්වා ගැනීමේ ක්‍රම මඟින් 1/3 කින් අඩු කර ගැනීම සහ මානසික සෞඛ්‍ය හා යහපැවැත්ම ප්‍රවර්ධනය කිරීම	• මද්‍යසාර හා මත් ද්‍රව්‍ය භාවිතය අවම කිරීම සහ සාරධර්ම අධ්‍යාපනය පිළිබඳ දැනුවත් කිරීම වැඩසටහන් 32ක් පැවැත්වීම • උපදේශන ජංගම සායන16 ක් පැවැත්වීම • ක්‍රීඩා තරඟ 16 ක් පැවැත්වීම • වෛද්‍ය සායන 16 ක් පැවැත්වීම • ග්‍රාමීය ක්‍රීඩාපිටි 16 ක් සංවර්ධනය • ක්‍රීඩා උපකරණ ලබාදීම සහ ක්‍රීඩා පුහුණුව සිදු කිරීම • සෑම ප්‍රාදේශිය ලේකම් කොට්ඨාශවල ශරීර සුවතා මධ්‍යස්ථාන ඉදිකිරීම.	35% 48%	70% 70%	80% 90% 100%
04.පරිපූර්ණ,සාධාරණ ගුණාත්මක අධ්‍යාපනයක් ලැබීම තහවුරු කිරීම සහ සෑමට ජීවිත කාලය පුරාම අධ්‍යාපනය ලැබීමේ අවස්ථාව ප්‍රවර්ධනය කිරීම.	2030 වන විට ඵලදායී ඉගෙනුම් ප්‍රතිඵල ලබා ගැනීමට හැකිවන ආකාරයෙන් සියළුම ගැහැණු ළමුන් හා පිරිමි ළමුන් නිදහස් සමාන සහ ගුණාත්මකභාවයෙන් ඉහළ ප්‍රාථමික හා ද්විතීක අධ්‍යාපනයක් සම්පූර්ණ කර සිටින බව තහවුරු කිරීම .	• ද්විතීය අධ්‍යාපනයෙන් පසු තරුණ තරුණියන් 100 ක් ඵලදායී තෘතීය අධ්‍යාපනයට යොමු කිරීම • සිසුන් 250 ක් සඳහා වෘත්තීය මාර්ගෝපදේශ ලබා දීම • දැනුවත් කිරීමේ වැඩසටහන් 16 ක් පැවැත්වීම • ශිෂ්‍යත්ව ප්‍රතිලාභ 05 ක් ලබා දීම		74% 73 %	80% 95%
05.ස්ත්‍රී, පුරුෂ සමානාත්මකතාවය අත්පත් කර ගැනීම සහ සියළු කාන්තාවන් සහ ගැහැණු ළමයින් සවිබල ගැන්වීම.	කාන්තාවන්ට හා ගැහැණු ළමයින්ට එරෙහිව සියළුම ස්ථානවල සිදු වන්නා වූ සියළුම ආකාරයකම වෙනස්කොට සැලකීම් තුරන් කිරීම.	• හිංසනයට මුහුණ දෙන්නන් වෙනුවෙන් මනෝ සමාජීය උපදේශන සහාය වැඩසටහන් 16 ක් පැවැත්වීම • ළමා ශ්‍රමය තුරන් කිරීම පිළිබඳ දැනුවත් කිරීම වැඩසටහන් 16 ක් පැවැත්වීම • විගමනික පවුල්වල සාමාජිකයන්ට දරුවන්ගේ සුරක්ෂිත තාවය සම්බන්ධව දැනුවත් කිරීම වැඩසටහන් 16 ක් පැවැත්වීම • පාසල තුල ළමා ආරක්ෂක කමිටු ස්ථාපිත කිරීම			100% 100% 100% 82%

		• අවධානමට ලක්ව සිටින දරුවන් සුරක්ෂිත කිරීමට අන්තර්ජාල මෘදු පද්ධතිය ස්ථාපිත කිරීම			90%
06. සැමට ජලය සහ සනීපාරක්ෂක පහසුකම් ලබාගැනීම සහ ඒවායේ තිරසර කළමනාකරණය සහතික කිරීම .	2030 වන විට සියළු දෙනාටම සමානත්වයෙන් යුක්තව සනීපාරක්ෂාව සහ ස්වස්තතාව ලබා ගැනීමට හැකියාව සහ එළිමහනේ මළපහ කිරීම තුරන් කිරීම සහ විශේෂයෙන්ම කාන්තාවන්ගේ, ගැහැණු ළමුන්ගේ සහ අවධානමට ලක් වී සිටින පුද්ගලයන්ගේ විශේෂ අවශ්‍යතාවයන් කෙරෙහි අවධානය යොමු කිරීම .	• සෞඛ්‍ය ආරක්ෂිත වැසිකිලි නොමැති පවුල් සඳහා වැසිකිලි ඉදිකිරීම. • පාසල් දරුවන් හා වැඩිහිටියන් දැනුවත් කිරීමේ වැඩසටහන් 16 ක් ක්‍රියාත්මක කිරීම. • පාසල් ලමුන් අතර පෝස්ටර් හා චිත්‍ර තරඟයක් පැවැත්වීම • රාජ්‍ය නොවන සංවිධානවල අවධානයට යොමු කර පවුල් 50 ට අවශ්‍ය පහසුකම් සැපයීම	45% 15%	73% 66%	
07. සියල්ලන් සඳහා දැරිය හැකි විශ්වාසනීය,තිරසර සහ නවීන බලශක්ති සැපයුම සහතික කිරීම	2030 වන විට සියළු දෙනාටම අඩු මිලකට ලබා ගත හැකි විශ්වාසදායි නවීන බලශක්ති මූලාශ්‍රවලට ප්‍රවේශ විය හැකි බව තහවුරු කිරීම.	• විදුලිය නොමැති පවුල් 100 ට විදුලිය ලබාදීමට ක්‍රමවේදයක් සැකසීම • පුනර්ජනණීය බලශක්ති ප්‍රභවයන් වෙත පවුල් 50 ක් යොමු කිරීම • ගොවි බිම් 50 ක් සඳහා සූර්ය බලයෙන් ක්‍රියා කරන වතුර මෝටර් සැපයීම	46 % 42 % 15 %		
08. සියල්ලන් සඳහාම පෝෂිත පරිපූර්ණ සහ තිරසර ආර්ථික වර්ධනය, පූර්ණ ඵලදායිව සහ යහපත් රැකියා ප්‍රවර්ධනය කිරීම.	ළමා ශ්‍රමය තහනම් කිරීම, කම්කරු අයිතීන් සුරක්ෂිත කිරීම, සියළු සේවකයන් සඳහා ආරක්ෂාකාරී සේවා පරිසරයක් තිබීම ප්‍රවර්ධනය කිරීම	• ව්‍යාත්තීය මාර්ගෝපදේශ සේවා ලබා දීම හා ව්‍යවසායකත්ව සංවර්ධනය • වයස අවු 18-60 ත් අතර පුද්ගලයන් හඳුනාගෙන රැකියා අවස්ථාව සැලසීම සඳහා පුහුණු කිරීම 16ක් පැවැත්වීම • වැඩිහිටි ව්‍යවසායකයන්ගේ තොරතුරු ලබාගැනීම හා හඳුනාගැනීම • ළමා ආරක්ෂණ ජාලයක් ග්‍රාමීය මට්ටමින් ස්ථාපිත කිරීම	45%	73% 72%	80 %
09. **සවිමත් යටිතල පහසුකම් ගොඩනැගීම, පරිපූර්ණ සහ තිරසර කාර්මීකරණය ප්‍රවර්ධනය කර නව්‍යකරණය දිරි**	සංවර්ධන වෙමින් පවත්නා රටවල දේශීය තාක්ෂණ සංවර්ධනය,පර්යේෂණ සහ නවෝත්පාදනය සඳහා සහය ලබා දීම, එකිනෙකා අතර කර්මාන්ත	• තාක්ෂණික පුහුණුවීම් සඳහා 100 දෙනෙකු යොමු කිරීම • දේශීය තාක්ෂණික සංවර්ධනයන්ට පුද්ගලයන් 150 ට මූල්‍යාධාර සැපයීම • පුද්ගලයන් 50 ට වෙළඳපලට පිවිසීමට අවශ්‍ය සහය ලබාදීම • යටිතල පහසුකම් සංවර්ධනය		73 %	98% 96% 83%

ගැන්වීම.	විවිධාංගිකරණය සහ නිෂ්පාදනයන් සඳහා වටිනාකම එකතු කිරීම සඳහා යෝග්‍ය ප්‍රතිපත්ති වාතාවරණයක් සැකසීම.	• කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාසායකින් බිහිකිරීම අරමුණින් Business Desk වැඩසටහන ක්‍රියාත්මක කිරීම • පාසල් හැරයන තරුණ තරුණියන් වෘත්තිමය කුසලතා වර්ධනයට උපායමාර්ගික සැලැස්ම(Lead to Leed) ක්‍රියාත්මක කිරීම			88% 85%
10. රටවල් තුළ සහ ඒවා අතර අසමානතාවය අඩුකිරීම	2030 වන විට වයස,ලිංගික බව,ආබාධිත බව, ජන වර්ගය,ජාතිය,ආගම හෝ ආරථික හෝ වෙනත් තත්වයක් පිළිබඳව තැකීමකින් තොරව සියළුදෙනාගේ සමාජ ආරථික සහ දේශපාලනික අන්තර්කරණය සවිබල ගැන්වීම සහ ප්‍රවර්ධනය කිරීම	• සමාජ ආරක්ෂණ ප්‍රතිලාභ ක්‍රියාත්මක කිරීම • සහජීවන සංගම් පිහිටුවීම හා සහජීවන කර්තවයන් ක්‍රියාත්මක කිරීම • සවිබල ගැන්විය යුතු පවුල් 80 ක් පාර්ශවයන් සවිබල ගැන්වීමට අවශ්‍ය ක්‍රියා මාර්ග ගැනීම			100% 100% 92%
11. නගර හා ජනාවාස පරිපූර්ණ, ආරක්ෂිත,සවිමත් සහ තිරසර ලෙස සකස් කිරීම.	2030 වන විට විශේෂයෙන්ම වාතයේ ගුණාත්මකභාවය සහ නාගරික සහ වෙනත් අපද්‍රව්‍ය කළමනාකරණය ඇතුලත්ව නගරය නිසා සිදුවන ඒක පුද්ගල අහිතකර බලපෑම අඩු කිරීම.	• ඉඩම් පරිහරණ සැලසුම් සැකසීම • ඝන අපද්‍රව්‍ය කළමනාකරණ ඒකක 02 ක් පිහිටුවීම • පොලිතින් හා ප්ලාස්ටික් භාවිතය 50 % න් අවම කිරීම		73% 54%	80%
12. **තිරසර පරිභෝජන සහ නිෂ්පාදන රටාවන් සහතික කිරීම.**	2030 වන විට අප ද්‍රව්‍ය උත්පාදනය වීම වැලැක්වීම , අඩු කිරීම, ප්‍රතිචක්‍රීයකරණය සහ ඒවා නැවත භාවිතා කිරීම මඟින් අඩු කිරීම.	• ආයතනික, කොට්ඨාස හා දිස්ත්‍රික්ක මට්ටමින් ව්‍යාපෘති 100 ක් සිදු කිරීම • ඝන අප ද්‍රව්‍ය කළමනාකරණ ඒකක 02 ක් පිහිටුවීම • පරිසර සංරක්ෂණ වැඩසටහන් ක්‍රියාත්මක කිරීම.		66% 54 %	83%
13. **දේශගුණික විපර්යාස සහ ඒවායේ බලපෑම්වලට එරෙහිව කඩිනමින් ක්‍රියාත්මක කිරීම.**	දේශගුණික බලපෑම්වලට ලක්වන පවුල් ප්‍රමාණය වාර්ෂිකව 10% දක්වා අඩුකිරීම	• දැඩි නියං තත්වය මත ජලය සපයා ගත නොහැකි ප්‍රදේශ වෙත ව්‍යාපෘති 05ක් ක්‍රියාත්මක කිරීම • ගංවතුර නිසා නිරන්තර සිදුවන හානි අවම කිරීමට අවශ්‍ය සංවර්ධන ව්‍යාපෘති 06 ක් ක්‍රියාත්මක කිරීම		74%	80%

		• රුක් රෝපණ ව්‍යාපෘති 548 ක් ක්‍රියාත්මක කිරීම			100%
14. තිරසර සංවර්ධනය සඳහා සාගර, මුහුදු සහ සාගර සම්පත් සංරක්ෂණය සහ පිරිමැසුම්දායි භාවිතය	සාගරයට එකතුවන අපද්‍රව්‍ය (නොදිරන) ප්‍රමාණය 20% දක්වා අඩුකිරීම	• සාගර සම්පත් සංරක්ෂණය පිළිබඳව දැනුවත් කිරීමේ වැඩසටහන් 08ක් ක්‍රියාත්මක කිරීම • වෙරළ පවිත්‍රතා වැඩසටහන් 08ක් ක්‍රියාත්මක කිරීම			100% 100%
15. භූගෝලීය පරිසර පද්ධතින්ගේ තිරසර භාවිතය, තිරසර වනාන්තර කළමනාකරණය, කාන්තාරීකරණයට එරෙහිව ක්‍රියාකිරීම, ප්‍රතිස්ථාපනය කර ආරක්ෂා කර ප්‍රවර්ධනය කිරීම ඉඩම් හායනය නැවැත්වීම සහ පුනරුත්ථාපනය සහ ජෛව විවිධත්ව විනාශය නැවැත්වීම.	ජීව විවිධත්වයන් සහ පරිසර පද්ධති සංරක්ෂණ කිරීමට සහ තිරසර අන්දමින් භාවිතා කිරීමට සියලුම මූලාශ්‍රයන්ගෙන් මුල්‍ය ප්‍රතිපාදන රැස් කිරීමට උනන්දු කිරීම	• වියළි කලාපයේ විල්ලු ආශ්‍රිත පරිසර පද්ධතියේ ජෛව විවිධත්වය සංරක්ෂනයට සහ තිරසර භාවිතයට ප්‍රජාව හුරු කිරීම • පරිසර සංවේදි කලාපයේ කෘෂිකාර්මික පිළිවෙන් ඇති කිරීමේ ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම (ESA) • ප්‍රජාව දැනුවත් කිරීමේ වැඩසටහන් 03 ක් ක්‍රියාත්මක කිරීම • රුක් රෝපණ වැඩසටහන් 04ක් ක්‍රියාත්මක කිරීම			100% 100% 100% 100%
16. තිරසර සංවර්ධනය සඳහා සාමකාමී සහ පරිපූර්ණ සමාජයන් ඇති කිරීම යුක්තිය සඳහා සැමට අවස්ථාව ලබා දීම සහ සෑම මට්ටමකම ඵලදායී වගකීම් සහිත පරිපූර්ණ ආයතන ගොඩ නැගීම.	උපත් ලියාපදිංචි කිරීමද ඇතුළුව 2030 වන විට සියළු දෙනාටම නීතිමය අනන්‍යතාවක් ලබාදීම	• කල්ගතවූ උපත් හා විවාහ ලියාපදිංචි කිරීමේ ජංගම සේවා 16ක් පැවැත්වීම • ජාතික හැඳුනුම්පත් ලබාදීමේ ජංගම සේවා 32 ක් පැවැත්වීම • ජනතාව දැනුවත් කිරීමේ වැඩසටහන් 16 ක් පැවැත්වීම		74 %	100% 100%

5.2 තිරසර සංවර්ධන ඉලක්ක සපුරා ගැනීමේ ජයග්‍රහණ හා අභියෝග

ජයග්‍රහණ

1. කුඩා හා මධ්‍ය පරිමාණ ව්‍යාසායකින් බිහිකිරීමේ අරමුණින් Business Desk වැඩසටහන් අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම
2. පාසල් හැර යන තරුණ තරුණියන් වෘත්තිමය කුසලතාවන්ගෙන් පිරිපුන් කිරීම සඳහා උපායමාර්ගික සැලැස්ම ක්‍රියාත්මක කිරීම. (Lead to Leed).
3. අත්‍යන්ත ඇගළුම් නිෂ්පාදනය ප්‍රවර්ධන සඳහා අවශ්‍ය කම්හල් පහසුකම් සංවර්ධනය.
4. ව්‍යවසායකත්ව සංවර්ධනය හා දරිද්‍රතාවය අවම කිරීමේ අරමුණින් සෞභාග්‍ය නිෂ්පාදන ගම්මාන ව්‍යිපෘතිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම

අභියෝග

1. දරිද්‍රතාවය ඉහල යාමට, සෞඛ්‍ය සම්පන්න නිරෝගි ජීවිත අහිමි වීමට, ගුණාත්මක අධ්‍යාපනයක් අහිමි වීමට ආදි වූ කරුණු රාශියකට හේතුවක් වූ මත්පැන් හා මත්ද්‍රව්‍ය භාවිතය අවම කිරීමට විවිධ වූ දැනුවත් කිරීම් වැඩසටහන් පැවැත්වූවද මත්ද්‍රව්‍ය සඳහා ඇබ්බැහි වන පිරිස දිනෙන් දින වැඩිවීම සිදුව ඇත.

2. සියළුම ජනතාවට ආරක්ෂිත පෝෂ්‍යදායි ප්‍රමාණවත් ආහාර ලැබීම තහවුරු කිරීම සාක්ෂාත් කිරීම ප්‍රබල ගැටළුවක්ව පවතින්නේ වසරේ වැඩි කාලයක් වියළි දේශගුණයක් පවතින පුත්තලම දිස්ත්‍රික්කය තුල ඇතිවන නියඟ තත්වය නිසා ගොවිතැන් විනාශ වීම සහ සතුන් විසින් ගොවිතැනට හානි කිරීම

3. මධ්‍යම පළාතට, කුරුණෑගල දිස්ත්‍රික්කයට හා අනුරාධපුර දිස්ත්‍රික්කය යන ප්‍රදේශ වලට ඇදහැලෙන අධික වැසි ජලය පුත්තලම දිස්ත්‍රික්කය හරහා මුහුදට ගලා බසියි. පුත්තලමට අධික වැසි ඇති නොවූවද දිස්ත්‍රික්කයේ පවතින භූගෝලීය පිහිටීම නිසා ගංවතුර ආපදාවන්ට නිරන්තරයෙන් මුහුණ දීමට සිදුවීම අභියෝගයකි.

4. 2020-2021 වසර තුල මුහුණු දුන් ගොලීය වසංගත තත්වය ප්‍රධාන අභියෝග විය.

6 පරිච්ඡේදය - මානව සම්පත් පැතිකඩ

6.1 සේවක සංඛ්‍යා කළමනාකරණය

ශ්‍රේණිය	අනුමත සේවක සංඛ්‍යාව	පවතින සේවක සංඛ්‍යාව	ඇබෑර්තු / (අතිරික්ත)**
ජ්‍යෙෂ්ඨ	56	51	05
තෘතියික	40	24	16
ද්විතියික	1154	1002	152
ප්‍රාථමික	177	133	44

6.2 ** ආයතනයේ කාර්ය සාධනය උදෙසා මානව සම්පත් හිඟය හෝ අතිරික්තයට බලපානු ලැබ ඇත්තේ කෙසේදැයි කෙටියෙන් සඳහන් කරන්න.

දැනට පවතින පුරප්පාඩු සම්පූර්ණ කිරීම සඳහා අදාළ අංශ වෙත තොරතුරු දැනුම් දී ඇත. ජ්‍යෙස්ඨ සහ තෘතික පුරප්පාඩු තනතුර වලට අදාළ රාජකාරි කටයුතු අඛණ්ඩව ක්‍රියාත්මක කිරීමට අභ්‍යන්තර වැඩපිළිවෙලක් යොදා ඇත. (රාජකාරි ආවරණ ,වැඩ බැලීම, රාජකාරි ඉටුකිරීම) ද්විතීයික නිලධාරින්ගේ පුරප්පාඩු සඳහා අභ්‍යාසලාභී උපාධිධාරී නිලධාරින් යොදවා රාජකාරි අඛණ්ඩව ක්‍රියාත්මක කරයි.

6.3 මානව සම්පත් සංවර්ධනය

අනු අංකය	වැඩසටහන	පුහුණු කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව	වැඩසටහන් කාල සීමාව(දින)	සමස්ථ ආයෝජනය දේශීය	වැඩසටහන් ස්වභාවය	නිමැවුම/ ලබා ගත් දැනුම*
1	පෞද්ගලික ලිපිගොනු කළමනාකරණය (මාර්ගගත)	14	දවස් 03	70,000	දේශීය	අදාළ විෂයයන් කුසලතා වර්ධනවීම හේතුවෙන් විෂය රාජකාරිවල ඵලදායිතාව වැඩිවීම
2	Payroll පරිගණක පුහුණුව (මාර්ගගත)	8	දවස් 03	40,000	දේශීය	අදාළ විෂයයන් කුසලතා වර්ධනවීම හේතුවෙන් විෂය රාජකාරිවල ඵලදායිතාව වැඩිවීම
3	රාජ්‍ය සේවයේ විනය කාර්යය පටිපාටිය	11	දවස් 03	55,000	දේශීය	අදාළ විෂයයන් කුසලතා වර්ධනය වීම හේතුවෙන් විෂය රාජකාරිවල ඵලදායිතාව වැඩිවීම
4	පොදු ප්‍රසම්පාදනය හා වත්කම් කළමනාකරණය	70	දවස් 03	140,000	දේශීය	අදාළ විෂයයන් කුසලතා වර්ධනවීම හේතුවෙන් විෂය රාජකාරිවල ඵලදායිතාව වැඩිවීම
5	කාර්යාල කළමණාකරණය සහ පරිපාලනය පිළිබඳ මාර්ගගත පුහුණුව - COMA (Online)	5	දවස් 03	50,000	දේශීය	අදාළ විෂයයන් කුසලතා වර්ධනවීම හේතුවෙන් විෂය රාජකාරිවල ඵලදායිතාව වැඩිවීම
6	විගණන තඩත්තුව පිළිබඳ පුහුණුව	20	දවස් 01	5,400.00	දේශීය	අදාළ විෂයයන් කුසලතා වර්ධනවීම හේතුවෙන් විෂය රාජකාරිවල ඵලදායිතාව වැඩිවීම
7	විශ්‍රා වැටුප් ගෙවීම් පිළිබඳ පුහුණු වැඩසටහන	40	දවස් 01	37,775.00	දේශීය	අදාළ විෂයයන් කුසලතා වර්ධනවීම හේතුවෙන් විෂය රාජකාරිවල ඵලදායිතාව වැඩිවීම

07 පරිච්ඡේදය - අනුකූලතා වාර්තාව

අංකය	අදාළ කර ගත යුතු අවශ්‍යතාව	අනුකූලතා තත්වය (අනුකූල වේ/ අනුකූල නොවේ)	අනුකූල නොවේ නම් ඒ සඳහා කෙටි පැහැදිලි කිරීම	අනුකූල නොවීම අනාගතයේ දී වළක්වා ගැනීමට යෝජනා කරන නිරවද්‍ය තීරණ ක්‍රියාමාර්ග
1	**පහත සඳහන් මූල්‍ය ප්‍රකාශ/ ගිණුම් නියමිත දිනට ඉදිරිපත් කොට තිබේ**			
1.1	වාර්ෂික මූල්‍ය ප්‍රකාශ	අනුකූල වේ		
1.2	රාජ්‍ය නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම	අනුකූල වේ		
1.3	ව්‍යාපාර හා නිෂ්පාදන අත්තිකාරම් ගිණුම් (වාණිජ අත්තිකාරම් ගිණුම)	අදාල නැත		
1.4	ගබඩා අත්තිකාරම් ගිණුම්	අදාල නැත		
1.5	විශේෂ අත්තිකාරම් ගිණුම්	අදාල නැත		
1.6	වෙනත්	අදාල නැත		
2	**පොත් පත් හා ලේඛන නඩත්තු කිරීම (මු.රෙ. 445)**			
2.1	රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ 267/2018 අනුව ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.2	පුද්ගල පඩිනඩි ලේඛන / පුද්ගල පඩිනඩි කාඩ්පත් යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.3	විගණන විමසුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම	අනුකූල වේ		
2.4	අභ්‍යන්තර විගණන වාර්තා ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.5	සියළුම මාසික ගිණුම් සාරාංශ (CIGAS) පිළියෙල කර නියමිත දිනට මහා භාණ්ඩාගාරයට ඉදිරිපත් කිරීම.	අනුකූල වේ		
2.6	චෙක්පත් හා මුදල් ඇණවුම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.7	ඉන්වෙන්ට්‍රි ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.8	තොග ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.9	හානි පාඩු ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.10	බැරකම් ලේඛනය යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		
2.11	උප පත්‍රිකා පොත් ලේඛනය (GA – N 20) යාවත්කාලීන කර පවත්වා ගෙන යාම.	අනුකූල වේ		

03	**මූල්‍ය පාලනය සඳහා කාර්යයන් අභිනියෝජනය කිරීම (මු.රෙ. 135)**			
3.1	මුල්‍ය බලතල ආයතනය තුළ බලතල පවරා තිබීම	අනුකූල වේ		
3.2	මුල්‍ය බලතල පවරා දීම පිළිබඳ ආයතනය තුළ දැනුවත් කර තිබීම	අනුකූල වේ		
3.3	සෑම ගනුදෙනුවක්ම නිලධාරීන් දෙදෙනෙකු හෝ ඊට වැඩි සංඛ්‍යාවක් හරහා අනුමත වන පරිදි බලතල පවරා දී තිබීම	අනුකූල වේ		
3.4	2014.05.01 දිනැති අංක 171/2004 දරණ රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය අනුව, රජයේ පඩිපත් මෘදුකාංග පැකේජය භාවිතා කිරීමේදී ගණකාධිකාරිවරයන්ගේ පාලනයට යටත්ව කටයුතු කිරීම	අනුකූල වේ		
4	**වාර්ෂික සැලසුම් සකස් කිරීම**			
4.1	වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.2	වාර්ෂික ප්‍රසම්පාදන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.3	වාර්ෂික අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
4.4	වාර්ෂික ඇස්තමේන්තුව සකස් කොට ජාතික අය වැය දෙපාර්තමේන්තුවට (NBD) නියමිත දිනට ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
4.5	වාර්ෂික මුදල් ප්‍රවාහ ප්‍රකාශය නියමිත දිනට භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
5	**විගණන විමසුම්**			
5.1	විගණනකාධිපතිවරයා විසින් නියම කොට ඇති දිනට,සියළුම විගණන විමසුම්වලට පිළිතුරු ලබාදී තිබීම	අනුකූල වේ		
6	**අභ්‍යන්තර විගණනය**			
6.1	මු.රෙ. 134(2) DMA/1-2019 අනුව ,වසර ආරම්භයේදී විගණකාධිපතිවරයා සමඟ සාකච්ඡා කිරීමෙන් අනතුරුව , අභ්‍යන්තර විගණන සැලැස්ම සකස් කිරීම	අනුකූල වේ		
6.2	සෑම අභ්‍යන්තර විගණන වාර්තාවකටම මාසයක කාලයක් තුළදී පිළිතුරු සපයා තිබීම	අනුකූල වේ		
6.3	2018 අංක 19 දරණ ජාතික විගණන පනතේ 40(4) උප වගන්තිය ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් කළමනාකරණ විගණන දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
6.4	මුදල් රෙගුලාසි 134(3) ප්‍රකාරව, සියළුම අභ්‍යන්තර විගණන වාර්තා වල පිටපත් විගණකාධිපතිවරයාට ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

7	**විගණන හා කළමනාකරණ කමිටු**			
7.1	DMA චක්‍රලේඛ 1-2019 අනුව , අවම වශයෙන් විගණන හා කළමනාකරණ කමිටු 04ක් වත් අදාළ වර්ෂය තුළ පවත්වාගෙන යාම	අනුකූල වේ		
8	**වත්කම් කළමනාකරණය**			
8.1	අංක 01/2017 දරණ වත්කම් කළමනාකරණ චක්‍රලේඛයේ 07 වන පරිච්ඡේදය අනුව, වත්කම් මිල දී ගැනීම හා අපහරණය කිරීම පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලය වෙත ඉදිරිපත් කර තිබීම.	අනුකූල වේ		
8.2	ඉහත සඳහන් චක්‍රලේඛයේ 13 වැනි පරිච්ඡේදය ප්‍රකාරව එම චක්‍රලේඛයේ විධි විධාන ක්‍රියාත්මක කිරීම සම්බන්ධීකරණය සඳහා සුදුසු සම්බන්ධතා නිළධාරියෙකු පත් කර එම නිළධාරියා පිළිබඳ තොරතුරු කොම්ප්ට්‍රෝලර් ජනරාල් කාර්යාලයට වාර්තා කර තිබීම	අනුකූල වේ		
8.3	රාජ්‍ය මුදල් චක්‍රලේඛ අංක 05/2016 අනුව, භාණ්ඩ සමීක්ෂණ පවත්වා අදාළ වාර්තා නියමිත දිනට විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
8.4	වාර්ෂික භාණ්ඩ සමීක්ෂණයෙන් අනාවරණය වූ අතිරික්ත, ඌණතා හා වෙනත් නිර්දේශ චක්‍රලේඛයේ සඳහන් කාලය තුළ සිදුකොට තිබීම	අනුකූල වේ		
8.5	ගර්හිත භාණ්ඩ අපහරණය කිරීම මු.රෙ.772 අනුව සිදු කිරීම	අනුකූල වේ		
9	**වාහන කළමනාකරණය**			
9.1	සංචිත වාහන සඳහා දෛනික ධාවන සටහන් හා මාසික සාරාංශ වාර්තා සකස් කොට නියමිත දිනට විගණකාධිපති වෙත ඉදිරිපත් කිරීම	අනුකූල වේ		
9.2	වාහන ගර්හිත වී මාස 06 කට වඩා අඩු කාලයකදී අපහරණය කර තිබීම	අනුකූල වේ		
9.3	වාහන ලොග් පොත් පවත්වා ගනිමින් ඒවා යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
9.4	සෑම වාහන අනතුරක් සම්බන්ධයෙන්ම මු.රෙ. 103, 104, 109, හා 110 ප්‍රකාරව කටයුතු කිරීම	අනුකූල වේ		
9.5	2016.12.29 දිනැති අංක 2016/30 දරණ රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 ඡේදයේ සඳහන් විධි විධාන ප්‍රකාරව, වාහන වල ඉන්ධන දහනය වීම නැවත පරීක්ෂා කිරීම	අනුකූල වේ		
9.6	කල්බදු කාල සීමාවෙන් අනතුරුව, බදු වාහන ලොග් පොත් වල සම්පූර්ණ අයිතිය පවරාගෙන තිබීම	අනුකූල වේ		
10	**බැංකු ගිණුම් කළමනාකරණය**			
10.1	නියමිත දිනට බැංකු සැසඳුම් ප්‍රකාශ පිළියෙල කර සහතික කර ඒවා විගණනය සඳහා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		

10.2	සමාලෝචිත වර්ෂයේදී හෝ ඊට පෙර වර්ෂ වල සිට ඉදිරියට රැගෙන ආ අක්‍රිය බැංකු ගිණුම් නිරවුල් කර තිබීම	අනුකූල වේ		
10.3	බැංකු සැසඳුම් ප්‍රකාශ වලින් අනාවරණය වූ හා ගැලපුම් කළ යුතුව තිබූ ශේෂ සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව කටයුතු කොට එම ශේෂ මාසයක කාලයක් ඇතුලත නිරවුල් කර තිබීම	අනුකූල වේ		
11	**ප්‍රතිපාදන උපයෝජනය**			
11.1	සලසා තිබූ ප්‍රතිපාදන ඒවායේ සීමාව ඉක්මවා නොයන පරිදි වියදම් දැරීම	අනුකූල වේ		
11.2	මු.රෙ. 94(1) ප්‍රකාරව, සලසන ලද ප්‍රතිපාදනයෙන් උපයෝජනය කළ පසු වර්ෂ අවසානයේ දී ඉතිරි ප්‍රතිපාදන සීමාව නොඉක්මවන පරිදි බැරකම්වලට එළඹීම	අනුකූල වේ		
12	**රජයේ නිළධාරීන්ගේ අත්තිකාරම් ගිණුම්**			
12.1	සීමාවන්ට අනුකූල වීම	අනුකූල වේ		
12.2	හිඟහිටි ණය ශේෂ පිළිබඳ කාල විශ්ලේෂණයක් සිදු කර තිබීම	අනුකූල වේ		
12.3	වර්ෂයකට වැඩි කාලයක සිට පැවත එන හිඟහිටි ණය ශේෂ නිරවුල් කර තිබීම	අනුකූල නොවේ	වසර ගණනාවකට පෙර සිට පැවත එන හිඟ හිටි ණය ශෙෂ ඇත.එම ණය ශේෂය කපාගැනීමට අවශ්‍ය කටයුතු කරමින් තිබේ.	
13	**පොදු තැන්පත් ගිණුම**			
13.1	කල් ඉකුත් වූ තැන්පතු සම්බන්ධයෙන් මු.රෙ. 571 ප්‍රකාරව කටයුතු කර තිබීම.	අනුකූල වේ		
13.2	පොදු තැන්පතු සඳහා වන පාලන ගිණුම යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
14	**අග්‍රිම ගිණුම**			
14.1	සමාලෝචිත වර්ෂය අවසානයේදී මුදල් පොතේ ශේෂය භාණ්ඩාගාර මෙහෙයුම් දෙපාර්තමේන්තුවට ප්‍රේෂණය කර තිබීම	අනුකූල වේ		
14.2	මු.රෙ.371 ප්‍රකාරව නිකුත් කළ තත්කාර්ය අතුරු අග්‍රිම, එම කාර්ය අවසන් වී මාසයක් ඇතුළත නිරවුල් කර තිබීම	අනුකූල වේ		

14.3	මු.රෙ.371 ප්‍රකාරව අනුමත සීමාව ඉක්මවා නොයන පරිදි තත්කාර්ය අතුරු අග්‍රිම නිකුත් කර තිබීම	අනුකූල වේ		
14.4	අග්‍රිම ගිණුමේ ශේෂය, භාණ්ඩාගාරයේ පොත් සමඟ මාසිකව සැසඳුම් කිරීම	අනුකූල වේ		
15	**ආදායම් ගිණුම**			
15.1	අදාළ රෙගුලාසි වලට අනුකූලව , රැස් කළ ආදායමෙන් ආපසු ගෙවීම් සිදු කොට තිබීම	අනුකූල වේ		
15.2	රැස් කර තිබූ ආදායම් තැන්පතු ගිණුමට බැර නොකොට සෘජුවම ආදායමට බැර කර තිබීම	අනුකූල වේ		
15.3	මු.රෙ. 176 අනුව හිඟ ආදායම් වාර්තා විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
16	**මානව සම්පත් කළමනාකරණය**			
16.1	අනුමත කාර්ය මණ්ඩල සීමාව තුළ කාර්ය මණ්ඩලය පවත්වාගෙන යාම	අනුකූල වේ		
16.2	කාර්ය මණ්ඩලයේ සියළුම සාමාජිකයන් වෙත රාජකාරී ලැයිස්තු ලිඛිතව ලබා දී තිබීම	අනුකූල වේ		
16.3	20.09.2017 දිනැති MSD චක්‍රලේඛ අංක 04/2017 ප්‍රකාරව සියළුම වාර්තා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුව වෙත ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
17	**මහජනයා වෙත තොරතුරු ලබා දීම**			
17.1	තොරතුරු දැන ගැනීමේ පනත හා රෙගුලාසි ප්‍රකාරව තොරතුරු නිළධාරියෙකු පත් කොට තොරතුරු ලබා දීමේ ලේඛනයක් යාවත්කාලීන කර පවත්වාගෙන යාම	අනුකූල වේ		
17.2	ආයතනය පිළිබඳ තොරතුරු එහි වෙබ් අඩවිය හරහා ලබා දී තිබෙන අතර, වෙබ් අඩවිය හරහා හෝ විකල්ප මාර්ග හරහා ආයතනය පිළිබඳ මහජනයාගේ ප්‍රශංසා/ චෝදනා පළ කිරීමට පහසුකම් සලසා තිබීම	අනුකූල වේ		
17.3	තොරතුරු දැන ගැනීමේ පනතේ 08 වන හා 10 වන වගන්ති ප්‍රකාරව වසරකට දෙවතාවක් හෝ වසරකට වරක් වාර්තා ඉදිරිපත් කර තිබීම	අනුකූල වේ		
18	**පුරවැසි ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීම**			
18.1	අංක 05/2008 හා 05/2018(1) දරණ රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යාංශ චක්‍රලේඛ අනුව පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තියක් සම්පාදනය කොට ක්‍රියාත්මක නර තිබීම	අනුකූල වේ		
18.2	එම චක්‍රලේඛයේ 2.3 ඡේදය පරිදි, පුරවැසි/ සේවා ලාභී ප්‍රඥප්තිය සම්පාදනය කිරීම හා ක්‍රියාත්මක කිරීමේ කටයුතු අධීක්ෂණය කිරීම හා ඇගයීම් සඳහා ආයතන විසින් ක්‍රමවේදයක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19	**මානව සම්පත් සැලැස්ම සම්පාදනය කිරීම**			

19.1	2018.01.24 දිනැති රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ අංක 02/2018 ඇමුණුම 02 ආකෘතිය පදනම් කරගෙන මානව සම්පත් සැලැස්මක් සකස් කොට තිබීම	අනුකූල වේ		
19.2	කාර්ය මණ්ඩලයේ සෑම සාමාජිකයෙකු සඳහාම වර්ෂයකට අවම වශයෙන් පැය 12 කට නොඅඩු පුහුණු අවස්ථාවක් ඉහත සඳහන් මානව සම්පත් සැලැස්ම තුළ තහවුරු කොට තිබීම	අනුකූල වේ		
19.3	ඉහත සඳහන් චක්‍රලේඛයේ ඇමුණුම 01 හි දැක්වෙන ආකෘතිය පදනම් කරගෙන සමස්ත කාර්ය මණ්ඩලය සඳහාම වාර්ෂික කාර්ය සාධන ගිවිසුම් අත්සන් කර තිබීම	අනුකූල වේ		
19.4	ඉහත චක්‍රලේඛයේ 6.5 ඡේදය ප්‍රකාරව මානව සම්පත් සංවර්ධන සැලැස්ම පිළියෙල කිරීම , ධාරිතා සංවර්ධන වැඩසටහන් සංවර්ධනය කිරීම , නිපුණතා සංවර්ධන වැඩසටහන් ක්‍රියාත්මක කිරීම පිළිබඳ වගකීම් පවරා ජ්‍යෙෂ්ඨ නිලධාරියෙකු පත් කොට තිබීම.	අනුකූල වේ		
20	**විද්‍යුත් පළාත් පාලන පද්ධතියක් ස්ථාපිත කිරීම**			
20.1	2018.07.19 දිනැති පළාත් පාලන චක්‍ර ලේඛ අංක 2018/e-Local Government-01 අනුව අන්තර්ජාලය හරහා අයදුම්පත්‍ර ඉදිරිපත් කිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා තිබීම .	අදාල නොවේ.		
20.2	අන්තර් ජාලය හරහා ගෙවීම් සිදුකිරීමට පුරවැසියන්ට පහසුකම් සලසා තිබීම .	අදාල නොවේ.		
20.3	පාරිභෝගින්ට හිතකර සේවාව සැපයීමෙ සඳහා පෙරටු කාර්යාලය හා (Front Offices) පාරිභෝගික සේවා මධ්‍යස්ථානය හඳුන්වා දී තිබීම.	අදාල නොවේ.		